ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 දෙසැම්බර් මස 15 වැනි දින |

## 2014 ඔක්තෝබර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී අපනයන ඉපැයුම්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයුම් මෙන්ම මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ලෙස වූ විදේශ විනිමය ලැබීම් අඛණ්ඩව ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය සතුටුදායක ලෙස වර්ධනය විය. ගෙවුම් තුලනයේ ජංගම හා මූල්‍ය ගිණුම්හි අපේක්ෂිත ලැබීම් සමඟින් 2014 වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ දී විදේශීය අංශය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නොවැම්බර් මාසයේ දී විශාල වශයෙන් සංචාරකයන් පැමිණීම ආරම්භ වීමත් සමඟ සංචාරක ඉපැයුම් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර උත්සව සමය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වර්ධනයන් සමඟ වෙළෙඳ හිඟයෙහි අපේක්ෂිත අඩුවීම ජංගම ගිණුමේ හිඟය අඩු වීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර විදේශීය සෘජු ආයෝජන, කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වන ලැබීම් හා පෞද්ගලික අංශයෙහි ලැබීම් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම ශක්තිමත් කිරීමට දායක වනු ඇත. මේ අනුව, මෑතකාලීනව රාජ්‍ය සුරැකුම්පත් හා හිමිකම් වෙළෙඳපොළෙහි වූ ඇතැම් විචලනයන් හමුවේ වුවද වසර අග වන විට ගෙවුම් තුලනය හිතකර අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### අපනයන ක්‍රියාකාරිත්වය

2014 ජූනි මාසයේ සිට අඛණ්ඩව මාසික වර්ධනයක් වාර්තා කළ අපනයන ආදායම, 2014 ඔක්තෝබර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 899 ක් දක්වා සියයට 13.7 කින් අඩු වූ අතර,

**2014 පළමු මාස දහය තුළ දී සමුච්චිත අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 9,187 ක් දක්වා සියයට 9.7 කින් වර්ධනය විය.** 2013 වසරේ වාර්තා වූ ඉහළම අපනයන ආදායම එම වසරේ ඔක්තෝබර් මාසයේ දී වාර්තා වීම, අපනයන ආදායමේ මෙම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 ඔක්තෝබර් මාසයේ දී අපනයන ආදායමේ අඩු වීමට ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති රෙදිපිළි හා ඇඟළුම් අපනයනය දායක වූ අතර අනතුරුව ප්‍රවාහන උපකරණ සහ රබර් නිෂ්පාදිත අපනයනය හේතු විය. 2014 ඔක්තෝබර් මාසයේ දී යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟළුම් අපනයනය පිළිවෙලින් සියයට 10.1 කින් සහ සියයට 8.4 කින් අඩු වීමත් සමඟ රෙදිපිළි සහ ඇඟළුම් අපනයන ආදායම සියයට 8.7 කින් අඩු විය. මේ අතර කුළුබඩු අපනයන ආදායම අඛණ්ඩව තවදුරටත් අඩු වූ අතර පෙර වසර සමඟ සැසඳීමේ දී අඩු නිෂ්පාදනයක් පැවතීම මේ සඳහා හේතු විය. තේ අපනයන ආදායම ද අඩු වූ අතර මේ සඳහා අපනයන මිල සහ පරිමාව යන දෙකෙහිම සිදු වූ අඩු වීම හේතු විය. එසේ වුවද, පොල් අපනයන ආදායම සියයට 51.5 කින් වර්ධනය වූ අතර ප්‍රධාන වශයෙන් පොල් මද නිෂ්පාදිත අපනයන ආදායමේ වූ සැලකිය යුතු වර්ධනය මේ සඳහා හේතු විය.

2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉතාලිය, ඉන්දියාව සහ ජර්මනිය ප්‍රධාන අපනයන ගමනාන්තයන් වූ අතර එය මුළු අපනයනයෙන් සියයට 50 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම**

| වර්ගය | 2013 ඔක්තෝබර් (එ.ජ.ඩො. මිලියන) | 2014 ඔක්තෝබර් (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2013 ජන - ඔක් (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන - ඔක් (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| 1. කාර්මික අපනයන | **771.7** | **663.4** | **-14** | **6,230.8** | **6,808.7** | **9.3** |
| රෙදිපිළි හා ඇඟළුම් | 436.4 | 398.4 | -8.7 | 3,563.0 | 4,058.2 | 13.9 |
| රබර් නිෂ්පාදිත | 94.5 | 77.8 | -17.7 | 710.4 | 747.3 | 5.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 38.1 | 31.6 | -17.1 | 378.1 | 319.3 | -15.6 |
| ප්‍රවාහන උපකරණ | 35.5 | 6.8 | -80.7 | 135.2 | 110.8 | -18.1 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 32.8 | 29.1 | -11.4 | 250.9 | 283.0 | 12.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 30.2 | 26.6 | -12.1 | 368.0 | 283.8 | -22.9 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 25.5 | 20.7 | -18.8 | 192.4 | 239.5 | 24.5 |
| වෙනත් | **78.7** | **72.4** | **-8.0** | **632.8** | **767.0** | **21.2** |
| 2. කෘෂිකාර්මික අපනයන | 257.7 | 231.1 | -10.3 | 2,094.9 | 2,311.4 | 10.3 |
| තේ | 146.8 | 134.3 | -8.5 | 1,249.7 | 1,351.0 | 8.1 |
| පොල් | 23.1 | 35.0 | 51.5 | 163.7 | 302.3 | 84.7 |
| මුහුදු ආහාර | 23.1 | 16.7 | -27.7 | 187.5 | 210.8 | 12.4 |
| කුළුබඩු | 41.0 | 24.5 | -40.3 | 294.5 | 212.9 | -27.7 |
| වෙනත් | **23.8** | **20.7** | **-13.1** | **199.6** | **234.4** | **17.4** |
| | **11.9** | **4.0** | **-66.2** | **49.0** | **66.7** | **36.1** |
| මුළු අපනයන | **1,041.30** | **898.5** | **-13.7** | **8,374.7** | **9,186.7** | **9.7** |


මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව


ආනයන ක්‍රියාකාරිත්වය

**2014 ඔක්තෝබර් මාසයේ දී ආනයන සඳහා වූ වියදම එ.ජ.ඩොලර් මිලියන 1,750 ක් දක්වා සියයට 25.6 ක ඉහළ අනුපාතයකින් වර්ධනය වූ අතර, සමුච්චිත වශයෙන් සැලකූ විට 2014 වසරේ පළමු මාස දහය තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 15,972 ක් දක්වා සියයට 7.3 කින් වර්ධනය විය.** 2014 ඔක්තෝබර් මාසයේ ආනයන වියදමෙහි වර්ධනය සඳහා විශේෂයෙන්ම ඉන්ධන ආනයන ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, අනතුරුව යතුරුපැදි හා මෝටර් රථ වැනි පෞද්ගලික පරිහරණය සඳහා වූ රථවාහන ආනයනයන්හි වූ කැපී පෙනෙන වර්ධනය ද හේතු විය. පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන අඩු මට්ටමක පැවතිය ද, බොරතෙල් ආනයන ඉහළ යාම හේතුවෙන් ඉන්ධන සඳහා වූ වියදම සැලකිය යුතු ලෙස වර්ධනය විය. තවද, වසර තුළ දී දේශීය සහල් නිෂ්පාදනය අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මෙම මාසය තුළ දී සහල් ආනයන ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග, තිරිඟු හා ඉරිඟු, කඩදාසි හා ඝන කඩදාසි, එළවළු හා කිරි නිෂ්පාදන ආනයන ද සලකා බලන මාසය තුළ ඉහළ මට්ටමක පැවතුණි. සියලුම උප කාණ්ඩවල වර්ධනයක් පෙන්නුම් කරමින් ආයෝජන භාණ්ඩ සඳහා වූ වියදම සියයට 12.9 කින් වර්ධනය විය. කෙසේ වුවද, පොහොර ආනයන පරිමාව සැලකිය යුතු ලෙස අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම මාසය තුළ දී පොහොර ආනයන වියදම අඩු විය.

2014 වසරේ පළමු මාස දහය තුළ දී, ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය යන රටවල් ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර මුළු ආනයනවලින් සියයට 58 ක් පමණ මෙම රටවලින් සිදු කරන ලදී.

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**



**සංඛ්‍යා සටහන 2: ආනයන වියදම**

| වර්ගය | 2013 ඔක්තෝබර් (එ.ජ.ඩො. මිලියන) | 2014 ඔක්තෝබර් (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2013 ජන - ඔක් (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන - ඔක් (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **286.2** | **411.5** | **43.8** | **2619.1** | **3065.3** | **17.0** |
| ආහාර හා පාන වර්ග | 101.7 | 169.4 | 66.5 | 1,128.1 | 1,316.7 | 16.7 |
| කිරි නිෂ්පාදිත | 25.7 | 28.2 | 10.0 | 238.0 | 292.6 | 22.9 |
| වෙනත් | 76.1 | 141.2 | 85.6 | 890.0 | 1,024.1 | 15.1 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 184.5 | 242.1 | 31.2 | 1,491.0 | 1,748.6 | 17.3 |
| රථවාහන | 59.6 | 117.7 | 97.4 | 479.5 | 691.1 | 44.1 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 33.8 | 33.7 | -0.4 | 316.9 | 313.9 | -0.9 |
| වෙනත් | 91.1 | 90.7 | -0.4 | 694.6 | 743.5 | 7.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **755.1** | **941.7** | **24.7** | **8,723.5** | **9,551.3** | **9.5** |
| ඉන්ධන | 225.9 | 329.1 | 45.7 | 3,491.4 | 4,072.9 | 16.7 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 186.2 | 217.3 | 16.7 | 1,688.9 | 1,886.1 | 11.7 |
| රසායනික නිෂ්පාදිත | 58.5 | 68.3 | 16.8 | 604.8 | 649.1 | 7.3 |
| ප්ලාස්ටික් හා උපාංග | 44.8 | 59.8 | 33.6 | 422.5 | 497.7 | 17.8 |
| මූල ලෝහ | 41.1 | 35.1 | -14.8 | 349.7 | 391.0 | 11.8 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 36.2 | 52.0 | 43.4 | 306.5 | 392.4 | 28.0 |
| තිරිඟු හා ඉරිඟු | 22.9 | 35.1 | 53.4 | 280.3 | 342.1 | 22.0 |
| වෙනත් | 139.4 | 145.0 | 4.0 | 1,579.4 | 1,320.1 | -16.4 |
| **3. ආයෝජන භාණ්ඩ** | **350.8** | **396.2** | **12.9** | **3,527.7** | **3,344.0** | **-5.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 172.8 | 197.6 | 14.4 | 1,868.5 | 1,743.9 | -6.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 124.2 | 135.2 | 8.8 | 1,134.8 | 1,083.7 | -4.5 |
| ප්‍රවාහන උපකරණ | 53.2 | 62.9 | 18.3 | 519.7 | 513.7 | -1.2 |
| වෙනත් | 0.6 | 0.5 | -26.7 | 4.8 | 2.8 | -41.9 |
| **මුළු ආනයන** | **1,393.7** | **1,750.2** | **25.6** | **14,882.0** | **15,972.5** | **7.3** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළෙඳ ශේෂය

**වෙළෙඳ හිඟය, 2013 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 352 ට සාපේක්ෂව 2014 ඔක්තෝබර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 852 ක් දක්වා පුළුල් විය.** 2013 වසර සඳහා වාර්තා වූ ඉහළම මාසික අපනයන ආදායම සහ අවම මාසික ආනයන වියදම 2013 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2014 වසරේ පළමු මාස දහය තුළ දී වෙළෙඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.3 කින් පුළුල් විය.

**සංචාරක ඉපැයුම්**

**2014 වසරේ ඔක්තෝබර් මාසයේ දී 121,576 ක සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා කළ අතර, එය වාර්ෂිකව සියයට 13.6 ක සතුටුදායක වර්ධනයකි.** මේ අනුව, වසරේ පළමු මාස දහය තුළ දී සමුච්චිත සංචාරක පැමිණීම් 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 1,228,754 දක්වා සියයට 21.5 කින් වර්ධනය විය. 2014 ඔක්තෝබර් මාසයේ දී සංචාරක ඉපැයුම් 2013 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 144 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 176 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. සංචාරක පැමිණීම්හි සැලකිය යුතු වර්ධනය මෙන්ම ඇස්තමේන්තුගත දෛනික සාමාන්‍ය වියදම ඉහළ යාම හේතුවෙන් 2014 වසරේ පළමු මාස දහය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයුම් 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් බිලියන 1.4 සිට එ.ජ.ඩොලර් බිලියන 1.8 දක්වා සියයට 30.4 ක වර්ධනයක් වාර්තා කළේය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

**2014 ඔක්තෝබර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 573 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 600 දක්වා සියයට 4.7 කින් වර්ධනය විය.** මේ අතර, 2014 වසරේ පළමු මාස දහය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සමුච්චිත ලැබීම් 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 5,236 සිට එ.ජ.ඩොලර් මිලියන 5,690 දක්වා සියයට 8.7 කින් වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

**2014 වසරේ පළමු මාස දහය තුළ රජය විසින් ලබාගත් දිගුකාලීන ණය එ.ජ.ඩොලර් මිලියන 1,411 ක් විය.** 2014 ජනවාරි මස සිට ඔක්තෝබර් මස අග දක්වා රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 109 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, 2014 නොවැම්බර් අග දක්වා කාලය තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත එ.ජ.ඩොලර් මිලියන 150 ක ශුද්ධ විදේශීය ආයෝජන ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. තවද, ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් 2014 සැප්තැම්බර් මාසයේ දී සිදු කළ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව තුළින් ලද එ.ජ.ඩොලර් මිලියන 250 ද ඇතුළුව 2014 වසරේ පළමු මාස දහය තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත වූ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 450 ක් විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

මූල්‍ය ගිණුම සහ ජංගම ගිණුම වෙත වූ අඛණ්ඩ විදේශ විනිමය ලැබීම් සමඟ 2014 වසරේ පළමු මාස දහය තුළ දී ගෙවුම් තුලනය 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ

දී වූ එ.ජ.ඩොලර් මිලියන 745 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,761 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

**ජාත්‍යන්තර සංචිත**

**2014 ඔක්තෝබර් මස අග වන විට, ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.8 ක් වූ අතර බැංකු අංශයේ විදේශීය වත්කම් ඇතුළත්ව මුළු විදේශීය වත්කම් එ.ජ.ඩොලර් බිලියන 10.3 ක් විය.** ආනයනික මාස වශයෙන් සැලකුවිට, 2014 ඔක්තෝබර් මස අග වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.5 කට සමාන වූ අතර මුළු විදේශීය වත්කම්, ආනයනික මාස 6.4 කට සමාන විය. එ.ජ.ඩොලර් මිලියන 1,980 ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ එ.ජ.ඩොලර් මිලියන 624 ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වූ ගෙවීම් හමුවේ වුවද ජාත්‍යන්තර සංචිත හිතකර මට්ටමක පවත්වා ගැනීමට හැකි වීම සැලකිය යුතු තත්ත්වයකි.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

**2014 දෙසැම්බර් මස 09 වන විට එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල සියයට 0.2 ක ආන්තික අවප්‍රමාණයක් පමණක් වාර්තා කරමින් ස්ථාවරව පැවතුණි.** කෙසේ නමුත්, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව 2014 දෙසැම්බර් මස 09 වන විට ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 11.9 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 14.8 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 5.2 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 7.7 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 7.9 කින් සහ චීන රෙන්මින්බිවලට එරෙහිව සියයට 1.8 කින් සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය විය. මේ අතර, 2014 දෙසැම්බර් මස 09 වන විට ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.3 කින් අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් (අ)

| | 2013 ඔක් (එ.ජ.ඩො. මිලියන) | 2014 ඔක් (එ.ජ.ඩො. මිලියන) | ඔක් වර්ධනය (සියයට) | 2013 ජන. සිට ඔක් (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන. සිට ඔක් (එ.ජ.ඩො. මිලියන) | ජන. සිට ඔක් වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,041.3 | 898.5 | -13.7 | 8,374.7 | 9,186.7 | 9.7 |
| ආනයන | 1,393.7 | 1,750.2 | 25.6 | 14,882.0 | 15,972.5 | 7.3 |
| වෙළෙඳ ශේෂය | -352.3 | -851.7 | 141.7 | -6,507.3 | -6,785.8 | 4.3 |
| සංචාරක ඉපැයුම් | 144.1 | 175.7 | 21.9 | 1,361.0 (ආ) | 1,775.3 | 30.4 |
| අනෙකුත් සේවා වෙළෙඳාම් වෙත වූ ලැබීම් (ඇ) | | | | 1,469.6 (ආ) | 1,670.5 | 13.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 573.0 (ආ) | 600.1 | 4.7 | 5,236.3 (ආ) | 5,689.7 | 8.7 |
| කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) | 10.2 | 59.7 | | 187.4 | 106.9 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 188.2 | 165.3 | -12.2 | 3,807.3 | 4,590.6 | 20.6 |
| එයින්: | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 41.5 | 26.7 | -35.7 | 2,328.9 | 1,637.1 | -29.7 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | | | | | 1,500.0 | |
| දිගුකාලීන ණය | 145.5 | 163.7 | 12.5 | 1,452.6 | 1,410.8 | -2.9 |
| විදේශීය සෘජු ආයෝජන (ඇ) | | | | 549.1 | 850.0 | 54.8 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) එක් එක් කාල පරිච්ඡේදය සඳහා අදාළ දත්ත පළමු භාගය සඳහා වේ.
(ඈ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.